# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල


| | | |
|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | |
| ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 | |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | |
| වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | |


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1702/2024 | |
| ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | |
| දිනය<br>திக<br>Date | 11/11/2024<br>පැය 1935 | |

**මාධ්‍ය නිවේදනය**

**පාස්කු දින ප්‍රහාරය සම්බන්ධව රූපවාහිණී නාලිකාවක විකාශය වූ වීඩියෝවක් පිළිබඳව විමර්ශන ආරම්භ කිරීම - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව.**

බ්‍රිතාන්‍ය රූපවාහිනී නාලිකාවක් වූ Channel 4 නාලිකාව විසින් ශ්‍රී ලාංකිකයෙකු වූ මොහොමඩ් මිහිලාල් මොහොමඩ් හන්සීර් නොහොත් අසාද් මවුලානා යන අය සමඟ සම්මුඛ සාකච්ඡාවක් පවත්වා තිබිණි. බාහිර සංවිධානයක් විසින් මෙම වීඩියෝව පිළිබඳව මහජන ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කරන ලද පැමිණිල්ලක්, පොලිස් මූලස්ථානය වෙත යොමු කිරීමෙන් පසු එහි විමර්ශන කටයුතු සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත බාර දී ඇත.

මෙම සම්මුඛ සාකච්ඡාව 2023.09.06 වන දින හෝ ඊට ආසන්න දිනකදී එම නාලිකාව මඟින් විකාශය කර තිබූ අතර, ඒ අනුව එම වීඩියෝවේ අඩංගු පාස්කු දින ප්‍රහාරය සම්බන්ධ ආන්දෝලනාත්මක කරුණු සහ දණ්ඩ නීති සංග්‍රහයේ සඳහන් කුමන්ත්‍රණය ඇතුළු චෝදනා කිහිපයක් යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මේ වන විට විමර්ශනයක් ආරම්භ කර ඇත.

මෙම විමර්ශනයට අදාලව 2024.11.11 වන අද දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කොටුව ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කරන ලදී.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**